සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව,

1. 46 කි. 2. 39 කි. 3. 27 කි. 4. 73 කි.

02) මුල් කිතුනු සභාවේ ආරම්භය ගැන සඳහන් වන්නේ,

1. මතෙව් ශුභාරංචියේ ය. 2. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේය.
3. කොරින්ති ලිපියේ ය. 4. ජාකොබ් ලිපියේ ය.

03) සමානකම් බහුල ශුභාරංචි හඳුන්වන පොදු නාමය,

1. ඉතිහාස ග්‍රන්ථ. 2. හසුන් පත්.
3. සමදර්ශක ශුභාරංචි. 4. දේව රාජ්‍යයේ ශුභාරංචි.

04) රෝමයේ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක්වූ කිතුනුවන් දිරිමත් කිරීමට ලියන ලද ශුභාරංචි ග්‍රන්ථය,

1. මතෙව්. 2. මාක්. 3. ලූක්. 4. ජොහාන්.

05) උප්පත්ති 3 ; 15 වගන්තියේ සඳහන් වන්නේ,

1. ආබ්‍රහම්ට දුන් පොරොන්දුවයි. 2. නෝවාට දුන් පොරොන්දුවයි.
3. මෝසෙස්ට දුන් පොරොන්දුවයි. 4. ආදි මව්පියන්ට දුන් පොරොන්දුවයි.

06) "මාගේ දඬුවම දැරිය නොහැකි තරම් දරුණුය" මෙම ප්‍රකාශය,

1. ආබෙල්ගේය. 2. ආදම්ගේය. 3. කායින්ගේය. 4. ඒසව්ගේය.

07) පාපයෙන් දූෂණය වූ මැවිල්ල විනාශ කිරීමට දෙවියන් වහන්සේ ගත් පියවර නම්,

1. බාබෙල් කොත. 2. නෝවා සහ ජලගැල්ම.
3. ඒදන් උයන රැකවල් කිරීම. 4. ආබ්‍රහම් තෝරා ගැනීම.

08) දේව අනුග්‍රහය යටතේ කානානීයවරුන්ට විරුද්ධව හමුදාපති බාරාක්ව මෙහෙයවූ වීරවරිය,

1. දෙබෝරා ය. 2. රූත් ය. 3. ජුදිත් ය. 4. එස්තර් ය.

09) ඉෂ්ට වරප්‍රසාදය අහිමි නොවූවත් ආධ්‍යාත්මික ජීවිතය දුර්වල වීමට බලපාන්නේ,

1. සුළු පාපය. 2. ජන්ම පාපය.
3. මරණීය පාපය. 4. බරපතල පාපය.

10) "තවත් පව් නොකරන්න" යැයි පවසා ජේසුස් වහන්සේ විසින් සමාව දෙනු ලැබුවේ,

1. සමාරීය ස්ත්‍රියටය.
2. කුදු ස්ත්‍රියටය.
3. කනානීය ස්ත්‍රියටය.
4. පව්කාර ස්ත්‍රියටය.

11) පාපොච්චාරණ පිළිවෙත් පළමු ප්‍රකාශය,

1. පියාණනි පව්කාර මට දඬුවම් දුන මැනව.
2. පියාණනි මා වෙනුවෙන් මැදිහත් වුව මැනවි.
3. පියාණනි පව්කාර වූ මට ආශිර්වාද කළ මැනවි.
4. පියාණනි මට සමාව දුන මැනව.

12) ස්වාමීන් වහන්සේගේ වචන අනුව සදාතන ජීවිතයේ හා උත්ථානයේ බල පරාක්‍රමයේ බීජය වන්නේ,

1. පාපොච්චාරණයයි.
2. අභිෂේකයාලේපයයි.
3. දිව්‍ය සත්ප්‍රසාදයයි.
4. පූජකවරයයි.

13) දෙවියන් වහන්සේට අයිති වස්තුවක් අප සතු කර ගැනීමට ගන්නා වූ උත්සහය,

1. අන් වස්තු ආශා කිරීමයි.
2. සිය දිවි හානිකර ගැනීමයි.
3. පොදු දේපළ විනාශ කිරීමයි.
4. ප්‍රතිමා වලට හානි කිරීමයි.

14) දුක් පීඩා කරන අය කෙරේ......
ඉහත ගීත කණ්ඩය සම්පූර්ණ කරන්න.

1. සැබැවින් දුක්වන්න.
2. ඉවසිලිමත් වන්න.
3. පිළිසරණය වන්න.
4. සාමය පතුරන්න.

15) මනුෂ්‍යයා පාරිශුද්ධ යැයි කීමට හේතුව,

1. ශරීරයක් තිබීම නිසාය.
2. ආත්මයක් තිබීම නිසාය.
3. බුද්ධිය තිබීම නිසාය.
4. දේව ස්වරූපය නිසාය.

16) හෙරෝද් ඇන්ටිපස් තම සහෝදරයාගේ බිරිඳ විවාහ කර ගැනීමෙන් කඩ කළ පනත,

1. පළමු පනත.
2. හත්වන පනත.
3. පස්වන පනත.
4. නවවන පනත.

17) කාර්මෙල් කන්ද මත පූජාසනයක් ඉදිකර යාගයක් ඔප්පුකළ දිවැසිවරයා,

1. එලීෂා
2. එලියා
3. නාතාන්.
4. ජෝනා.

18) ලූක් සුපුවතේ "මෙහෙසුරු දිවැසිවර" යන නාමයෙන් හඳුන්වා දී ඇත්තේ,

1. පේදුරුතුමාය.
2. ජොහාන්තුමාය.
3. ස්නාවක ජොහාන්තුමාය.
4. ජුසේතුමාය.

19) ක්‍රිස්තියානි යැදුම් සම්ප්‍රදාය තුළ යාච්ඤාවේ ප්‍රභේද,

1. තුනකි.
2. හතරකි.
3. පහකි.
4. හයකි.

20) අසිපා වැඩසටහනේ ශුද්ධ ලියවිලි පාඨය කියවීම ඇතුළත් වන්නේ කවර පියවරෙහිද?

1. පළමුවන ය.
2. දෙවන ය.
3. තෙවන ය.
4. සිව්වන ය.

(ලකුණු : 2 X 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) i. පූරාණ ගිවිසුමට අයත් පොත් කාණ්ඩ දෙකක් නම් කරන්න.
   ii. විලාප ගීතිකා දෙවර්ගය නම් කරන්න.
   iii. නෝවාගේ පුතුන් දෙදෙනෙක් නම් කරන්න.
   iv. ඊශ්‍රායෙලයේ ප්‍රථම රජු හා ඔහුව අභිෂේක කළ පුද්ගලයා නම් කරන්න.
   v. කර්ම පාපයක දී දේව පනතක් කඩවිය හැකි ආකාර දෙකක් ලියන්න.
   vi. ශුද්ධ වූ අගොස්තීනුතුමාගේ ජීවිත වෙනසට බලපෑ කරුණු දෙක ලියන්න.
   vii. පස්වන පනත කඩ වන ආකාර දෙකක් නම් කරන්න.
   viii. හය, නවය පනත් සුරැකීම සඳහා ජීවිත පූජා කළ සාන්තුවරියන් දෙදෙනෙක් නම් කරන්න.
   ix. භාවනාවේ දී සොයා යන කරුණු දෙක ලියා දක්වන්න.
   x. ලූක් සුභාරංචියේ සඳහන් ප්‍රශංසා ගීත දෙකක් සඳහන් කරන්න. (ලකුණු : 2 x 10 = 20)

02) i. නව ගිවිසුමේ පොත් කාණ්ඩ දෙකක් නම් කරන්න.
   ii. ගීතාවලිය ග්‍රන්ථයට භාවිත වන වෙනත් නම් තුනක් ලියන්න.
   iii. සුභාරංචි ඇසුරින් නව යොවුන් වියේ දරුවන් සඳහා සුදුසු මඟපෙන්වීම් පහක් කෙටියෙන් සඳහන් කරන්න.
(ලකුණු : 2+3+5 = 10)

03) i. සමිදාණන් වහන්සේ විසින් බලවත් කරන ලද වීර නායකයන් දෙදෙනෙක් නම් කරන්න.
   ii. සාවුල්, දාවිත්, සලමොන් යන රජවරු තිදෙනා කළ සේවාවන් එක බැගින් ලියන්න.
   iii. වීරවරුන්ගේ හා රජවරුන්ගේ ජීවිත ඇසුරින් උගත හැකි නායකත්ව ගුණාංග පහක් ලියා දක්වන්න.

04) i. ස්වර්ගයට මොර ගසන පාපයන් දෙකක් නම් කරන්න.
   ii. දේව වරප්‍රසාදය කරණකොටගෙන ඇතිවන ප්‍රතිඵල තුනක් ලියන්න.
   iii. පාප අඳුරෙහි ම ගිලී ජීවත් වන පුද්ගලයකුට සිත හරවාගෙන යහමගට ගමන් කිරීම සඳහා සහය වීමට ඔබ කරන යෝජනා පහක් සඳහන් කරන්න.

05) i. හය සහ නවය පනත් නම් කරන්න.
   ii. හයවන පනතට විරුද්ධ ක්‍රියා තුනක් නම් කරන්න.
   iii. පිවිතුරු බව රැක ගැනීම සඳහා ඔබට කළ හැකි දේවල් පහක් සඳහන් කරන්න.

06) i. ජුසේවාස් පියතුමා මහනුවර දී සිදුකළ ප්‍රාතිහාර්යය හා රජ සමය නම් කරන්න.
   ii. 1 රාජාවලිය 3 ; 9 ට අනුව දෙවියන් වහන්සේගෙන් සලමොන් රජතුමා ලද වරප්‍රසාද තුනක් සඳහන් කරන්න.
   iii. "කිතුනු ජනතාව ආධ්‍යාත්මිකව වර්ධනය කිරීම සඳහා යාච්ඤාව ඉවහල් වේ." ඔබගේ දේවස්ථාන සංසයේ ජනතාව යාච්ඤා ජීවිතයට සමීප කිරීම සඳහා ඔබට කළ හැකි ක්‍රියාකාරකම් පහක් යෝජනා කරන්න.

07) කැමති මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   i. ශුද්ධවූ අගොස්තීනුතුමා.
   ii. ශුද්ධවූ දොමිනික් සාවියෝතුමා.
   iii. සමගි සන්ධානයේ ප්‍රසා.
   iv. රෝගීන් ආලේපය. (ලකුණු : 2 x 5 = 10)

(4) WWW.PastPapers.WiKi (3)

Download Term Test Papers, Short Notes From One Place!

(4) WWW.PastPapers.WiKi (4)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

# කතෝලික ධර්මය – පිළිතුරු පත්‍රය

නම / විභාග අංකයඃ

## I - කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 1 | 6 - 3 | 11 - 3 | 16 - 4 |
| 2 - 2 | 7 - 2 | 12 - 3 | 17 - 2 |
| 3 - 3 | 8 - 1 | 13 - 2 | 18 - 3 |
| 4 - 2 | 9 - 1 | 14 - 4 | 19 - 1 |
| 5 - 4 | 10 - 4 | 15 - 4 | 20 - 2 |

## II - කොටස

01) i. පංච පුස්තකය / ඉතිහාස පොත් / දිවැසිවර ග්‍රන්ථ / ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථ / එළිදරව්වාදී ග්‍රන්ථ

ii. පෞද්ගලික විලාප ගීතිකා / සාංඝික හෝ ජාතික අයාචනා

iii. ෂෙම්, හාම්, ජපෙත්.

iv. සාවුල් - සාමුවෙල්

v. සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන්, අතපසු කිරීමෙන්.

vi. මවගේ බලවත් යාච්ඤාව / අම්බ්‍රෝසිතුමාගේ මග පෙන්වීම.

vii. මත්පැන් පානය / දුම්පානය / මත් ද්‍රව්‍ය භාවිතය / අහිතකර ආහාර පුරුදු.

viii. ශුධවූ මරියගොරිත්තිතුමිය / ශුධවූ ඇග්නස් තුමිය.

ix. කිතුනු ජීවිතයේ පරමාර්ථය / කිතුනු ජීවිතය ගත කළ යුතු ආකාරය.

x. මරිය උදාන ගීය / සකරියස්තුමාගේ ප්‍රශංසා ගීය / සිමියොන්තුමාගේ ප්‍රශංසා ගීය.

02) i. ඉතිහාස පොත් සහ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත / හසුන් / එළිදරව්ව.

ii. ගී කළඹ / ඊශ්‍රායෙල් ජනතාවගේ යැදුම් පොත / ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත.

iii. නව ගිවිසුමේ සඳහන් ඕනෑම ඉගැනවීමක් අදාළ වේ.

03) i. සැම්සොන්. / ගිඩියොන්.

ii. සාවුල් - රාජ්‍යය එක්සේසත් කිරීම. / ප්‍රබල රාජ්‍යයක් ගොඩනැගීම.
දාවිත් - ගිවිසුමේ කරඬුව ජෙරුසලමට ගෙන ඒම. / පිලිස්ති යෝධයා මරා රාජ්‍ය බේරා ගැනීම.
සලමෙන් - දේව මාළිගය ගොඩ නැගීම.

iii. රට වෙනුවෙන් සේවය කිරීම. / අවංක වීම. / නිවැරදි හෘද සාක්ෂියකින් කටයුතු කිරීම. / තම වැරදි පිළිගැනීම. / දේව ගරු බිය ඇතිව සිටීම / සැමගේ යහපත උදෙසා කටයුතු කිරීම.

(2) www.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

04) i. මිනී මැරීම / දුගීන්ට හිංසා කිරීම / සේවකයන්ගේ වැටුප් වංචා කිරීම / අස්වාභාවික මෛථූනය.

ii. කිතුනුවාගේ ජීවිතය නව මඟකට පිවිසීම.
දිව්‍ය ජීවිතයකට හවුල් වීම.
පාපි වූ ජීවිතයෙන් මිදීම හා කෙලෙස් දමනය කර ගැනීමට අනුග්‍රහය ලැබීම.

iii. දෙවියන් වහන්සේ පව්කරුවන්ට ආදරය බව / ඔවුන් සිත හැරී එනතුරු බලා සිටින බව / කෙතරම් බරපතළ පාපයන්ට වුවද මනස්ථාපනය තුළ සමාව දෙන බව / අගොස්තීනුතුමා පාපයෙන් මිදීම ලද කෙනෙක් බව / ජීවිත වෙනසක් තුළ ප්‍රීතිය ලැබෙන බව.

05) i. කාමමිථ්‍යාචාරය නොකරන්න / පරදාර ආලය නොකරන්න.

ii. අසභ්‍ය පොතපත කියවීම / අසභ්‍ය චිත්‍ර හා චිත්‍රපට නැරඹීම / බහු භාර්යා බහු පුරුෂ සේවනය / ස්ත්‍රී දූෂණ / බාල අපයෝජන / පූර්ව ලිංගික සබඳතා.

iii. අන් අයට ගරු කිරීම / ආත්ම දමනය / යාච්ඤා කිරීම / ශරීරයට ගරු කිරීම / පිරිසිදු ජීවිතයක් ගත කිරීම / දෙවිඳුන්ට ප්‍රසන්න දේ පමණක් කිරීම.

06) i. යාච්ඤා කර වැස්ස ලබා දීම / දෙවන විමලධර්මසූරිය රජසමය.

ii. තියුණු නැණ නුවණද / ධනය / ගෞරවය.

iii. යාච්ඤා මෙහෙයක් සංවිධානය / ගෙයින් ගෙට ගොස් යාච්ඤා කිරීම / ගීතාවලියේ ගීත ගායනය / කුඩා පිරිස් වශයෙන් භාවනා ප්‍රගුණ කිරීම / ශු.බයිබලය භාවිතයෙන් යාච්ඤා කිරීම / මුද්‍රිත යාච්ඤා කිරීම.

07) i. පිටුව 54

ii. පිටුව 88

iii. පිටුව 59

iv. පිටුව 62 - 63

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න